සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021 පැය 03 යි
கண்டுபிடிப்பு சோதனை 03 மணி நேரம்
Diagnostic Test 03 Hours

සිංහල - I 12ශ්‍රේණිය
சிங்கள -I தரம் 12
Sinhala - I Grade 12

සැලකිය යුතුයි

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1. **අ)** ''නුවණ නැති පියාණන්ගේ සමවාය නපුරු හෙයින් බුදුන් කරා ගොස් වැඳ පියන්ට වේවයි දනක් දී පියන්ට වේවයි බණක් අසා පියන්ට වේවයි මේ සොළොස් අවුරුද්දෙන් අට අවුරුද්දක් විතරක් නොවී ය. දැන් ළඟට ගොස් වැඳ ගන්නට පයත් අවසඟය. වැද හෙවත් අත ඔසවා නළල තබා වඳින්ට අතක් නො නැමෙයි. අනෙක් කළ මනා දෙයකුත් නො පෙනෙයි. සිත පහදවා ගැන්මෙහි අදහස් ලැබෙන බැවින් ආයාස නැත . මේ අවස්ථාවට පිළිවන් ව තිබෙන සිත පැහැදීම ම කෙරෙමි' යි සිතා පිළියමට දෛව නැතත් බුදුන් දකින්නට දෛව ඇති බැවින් දැක සිතා පහදවා බුදුන් වැඩි ගමන සාර්ථක කළහ. බුදුහුත් බර එසවිය නොහෙන්නවුන්ට ශරීර භාරයම සැහෙන්නා සේ යන "මෝහට මේ විතරෙක් ම සෑහෙයි. සිතා වදාරා ලා ශරීරගත වූ පාණ්ඩු රෝගයට පිළියම් නො ලැබ මියන මට්ටකුණ්ඩලීන් ට ද පරලොවදී කාය පීඩා නැමැති රෝග හට නොගන්ට චිත්තප්‍රසාද නැමැති පිරියම් කරවා වැඩි සෙක්"

   i. මට්ටකුණ්ඩලී ට බුදුන් සමීපයට ගොස් වැඳ ගැනීමට නොහැකි වූයේ කුමක් නිසා ද?
   ii. බුදුන් වැඩි ගමන සාර්ථක වූයේ කෙසේද?
   iii. "බුදුහු ත් බර එසවිය නොහෙන්න උන්ට ශරීර භාරය ම සැහෙන්නා සේ " යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
   iv. "අවසඟ ය" යන පදයේ අර්ථය දක්වන්න. (ලකුණු04 යි)

**ආ)** ''ගිය ජාතියෙහි ඒ කුමාරිකාවෝ යම් ක්‍රොධයක් හේතු කොටගෙන තමන් වැදූ මෑණියන් ට " චණ්ඩාල කෙල්ල" යි බිණුවාහු ද ඒ අකුසල කර්මය නිසා උත්තම ජනයන් විසින් පිළිකුල් කටයුත්තා වූ හනී ජාතියෙහි චණ්ඩාල ව උපන්හ. එම කාලයෙහි ඒ කුමාරිකාවෝ බුදුන්ගේ තුන් ලෙවුහි ව්‍යාප්තව සිටි නව අරහාදී වූ ගුණධර්මයන් සලකා යම් මල් පූජාවක් කළාහු ද ඒ කුසල කර්මයාගේ ආනුභාවයෙන් බැලූ බැලූවන්ට ඉතා පියකරු වූ මනෝඥ වූ රූ ඇති වූහ. මේ ලෝකයෙහි යම් කිසි කෙනෙක් යම් යම් ආකාරයකින් පින් පව් දෙකම කළාහු වී නම් ඔහු තමන් විසින් කරන ලදදා වූ ඒ

ඒ කුසලාකුසල කර්මයට සුදුසු පරිද්දෙන් මනෝඥ වූ නානාවර්ණ වූ මොනරුන් මෙන් එහි විපාක ලබන්නාහු මය"

i. කුමාරිකාව හීන ජාතියෙහි උප්පත්තිය ලැබීමට හේතු පාදක වූ කරුණ කුමක්ද?
ii. කුමාරිකාවට මනෝඥ වූ රූ ඇති වීමට හේතු වූ කරුණ පහදන්න.
iii. පින් පව් දෙක සුදුසු පරිද්දෙන් විපාක දෙන ආකාරය සමාන කර ඇත්තේ කුමකටද?
iv. "තුන් ලෙව්හි" යන පදයේ අර්ථය පහදන්න. (ලකුණු 04 යි)

ඇ) "දීපංකර පාදමූල නිදානයෙහි පටන් සමතිස් පෙරුම් පුරා කෙළවර පාරමිතා ධර්ම නමැති ඔටුන්නෙහි අග්‍ර මාණික්‍යයක් බඳු වූ වෙස්සන්තර ජාතකයෙහි පුත්‍රදාරාදීන් පරිත්‍යාගයෙන් සත්වරක් මහ පොළොව ගුගුරුවා දෙ වැනි අත්බැව්හි තුසී පුරයෙහි ඉපිද සත් පනස් කෙළ සැට ලක්ෂයක් අවුරුදු දෙවියන්ට ධර්ම දේශනාකොට දස දහසක් ලෝක ධාතුයෙහි දෙව්බඹුන්ගේ අයජමෙන් මහ පස් බැලුම් බලා මව්කුස පිළිසිඳ ගත් බව ද ලුම්බිණි වනෝද්‍යානයෙහි මහා බ්‍රහ්මයා අතට බිහි ව වැඩිවිය පැමිණි සියලු ලෝක ධාතුයෙහි අසදෘශාභිෂේක ප්‍රාප්ත ව උයන් කෙළියට යන සඳ දෙවියන් මවා ලූ ජීර්ණ ව්‍යාධි මෘත යන තුන් පූර්ව නිමිත්ත දැක මහණ වීමෙහි උත්සාහ ඇති ව මහබිනික්මන කළ බව ද සා අවුරුද්දක් පටන් සැරි සරා වෙසඟ මස මැදි පොහෝ දවස බෝමැඩ විදුරසුන් අරා වැඩ හිඳ බුදු ව ක්‍රමයෙන් සත් සති ගෙවා අටවෙනි සතියෙහි මහබඹ අයජමෙන් බරණැස ඉසිපතන නම් උයනෙහි දම්සක් පවත්වා දෙව් බඹුන් විනයනය කළ පරිදි..."

i. පාරමිතා ධර්ම නැමැති ඔටුන්නෙහි අග්‍ර මාණික්‍යයකට සමාන කරන්නේ කුමක් ද?
ii. මහණ වී මෙහිලා උත්සහ ඇති වූයේ ඇයි?
iii. "සමතිස් පෙරුම් " යන පදයේ අර්ථය දක්වන්න.
iv. "වෙසඟ මස මැදි පොහෝ දවස" යන්න ලිහිල් බසින් ලියන්න. (ලකුණු 04 යි)

ඉ) මහානාම නම් ශාක්‍යයෝ තමන් මලණුවන් මෙකී අනුරුද්ධ කුමාරයන් ළඟට කැඳවාලා " මලණ්ඩ, බුදුන් කරා ගොස 'අප දෙබෑයන් අතුරෙන් එක් කෙනෙකුන් මහණ වුව මැනව එම මහණ වෙන්ඩ තොපි මහණ වූව මැනව, මම මහණ වෙම් ද, තොපි මහණ වවු දූ" යි විචාළහ. එබසට අනුරුද්ධ කුමාරයෝ කියන්නාහු "බෑණන් වහන්ස ! බුදුන් කෙරේ මහණ වූ කල එක් වේලේ කැව මනාල, එසේ වූ බතත් දොර දොර සිඟා ඇවිද ලද මනාල, බඩසාය'යි කිය නො හැකිල, ඇඹුල් ලුණු බෝය, මදයැ යි කියා නො හැකිල, හුණු කැමති සිහිල් ලැබේල, සිහිල් කැමති හුණු ලැබේල, දිවි හිමියෙන් එකලාව ම හොත මනාල, රුක්මුල් සුසාන භූමිවල භාවනා කොට ඇවිද්ද මනාල, එසේ වූ දුක් මම බිඳ ගත නො හෙමි" යි කීහ.

i. "දෙබෑයන් අතුරෙන්..." යන්නෙහි මෙහි සඳහන් පරිදි දෙබෑයන්ට අයත් වන දෙදෙනා සඳහන් කරන්න.
ii. "එසේ වූ දුක් මම විඳ ගත නොහෙමි" ලෙස කුමරු දුකක් ලෙස දකින කරුණු දෙකක් දක්වන්න.
iii. "දිවිහමියෙන් එකලාව හොත මනාල" යන උධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. "දෙබෑයන් "යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

ඊ) උදා දිනිඳු කර හරණේ
වීදා අඳුරු දිසි කිරණේ
යොදා දෙපස රන් තොරණේ
සදා මෙලෙස පුර දෙරණේ

සුවඳ සඳුන් කොකුමගරා
පැහැද තමන් වෙර තවරා
නොමඳ සලෙළු දන එපුරා
නිබඳ කෙළිති සතොස පුරා

i. මෙම පද්‍යය දෙකෙන් විස්තර වන අවස්ථාව කුමක් ද?
ii. රන් තොරණ සමාන කර ඇත්තේ කුමකට ද?
iii. සලෙළුන් හැසිරී ඇත්තේ කෙලෙස ද?
iv. "වෙර තවරා" යන්න අර්ථ දක්වන්න.

උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. "තව්තිසා දෙව්ලොව උපනිමි" යි
ii. "ස්වාමීනි ! තෙල නැති පූ කැව මැනව"
iii. "මේ තැන්හි නො වසව"
iv. "එම්බල සගය, තාගේ දුවක් කුල වන්තයන් මිස සමාන ජාති ඇති පුරුෂයන් නො කැමැත්තීල"
v. "එන්න අද විතරක්වත් ගේ ඇතුළෙ නිදාගන්න"
vi. "අයියෝ ! එතකොට අපට වෙන්නේ බඩගින්නෙ මැරෙන්ඩ"
vii. "පියා දෝ ඇගේ නොදනිමි ඔහු, මං මුලා වී දෝ ඒ දෙදෙනා ම"

(ලකුණු 3*4=12යි)

එ) පහත දැක්වෙන කාව්‍යය නිර්මාණයෙහි ආකෘතියෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි සුවිශේෂීතා කෙරෙහි අවධානය යොමු කරමින් නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

දුදනොද බිඳ
ලද තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ

මගේ කුකුළා නැසූ එකා
දදය ඔබගෙ පාළු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නොදී මකා

බලා එල්ල
හෙළුව හෙල්ල
මුලැ මැ බෙල්ල
මරු තැනේ

කතරගමට රුහුණු රටේ
සිඟා කකා ලබන විටේ
පයින් මැ ගොස් ඇවිද වටේ
පොළොව උලා නළල් ඇටේ

දිගට ඇදී
නැග පැහැදී
මර හඬ දී
දෙවියනේ

රනින් කුකුළු රුවක් පුදමි
රිදියෙන් බිජු වටක් පුදමි
රන් දුනු හී දෙකක් පුදමි
රුවට රිදී රුවක් පුදමි

කතර ගමේ
බල මහිමේ
දුටුද එමේ
හැම තැනේ

කියමින් නමකුරු ඔබගේ
බොළඳුන්ගේ ද කිරි තුඩ ගේ
රඟ දෙන්නට වඩිමි අගේ
එතකින් හමී සඳිනි මගේ
දුදනොද බිඳ
ලද තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ

මට කළ මේ විපත අනේ
බලා - ගන්නැ දෙවියනේ
වැජඹෙන නා මෙ විමනේ
බලන්නැ නා සාමිනේ

(ලකුණු 12 යි)

2. "මට්ටකුණ්ඩලී කතා වස්තුව තුළ අදින්නපුබ්බක බමුණාගේ ගූඪ සිත මැනැවින් නිරූපණයට උචිත අවස්ථා ගෙන හැර පෑමට කතු හිමියන් සමත් වී ඇත." සද්ධර්මරත්නාවලියේ එන මට්ටකුණ්ඩලී කතා වස්තුව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

නැතහොත්

"ස්ත්‍රියගේ සුචරිතය විවරණයට ජාතකකතාකරුවා සමත් වී ඇත." චන්දකින්නර ජාතකය ඇසුරින් පහදන්න.

(ලකුණු 15 යි)

3. "නොසන්සිදෙන ආශාවන් සපුරා ගැනීමට යොමු වීමෙන් වටිනා මිනිස් දිවිය ඛේදනීය අයුරින් කෙළවර වන ආකාරය සියුම් උපහාසයකින් යුතුව මිනිස් සිතට ඒත්තු ගැන්වීම සද්ධර්මාලංකාර කතුවරයා විසින් සිදු කරයි." සද්ධර්මාලංකාරයේ එන ස්වර්ණතිලකා වස්තුව ඇසුරින් විමසන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

"පූජාවලි කතුවරයා කතා පුවත් ඉදිරිපත් කිරීමේ දී හසුරවන භාෂාවේ ස්වභාවය කතා පුවත ජීවමය ගුණයෙන් පුරවාලයි." සුදුසු උදාහරණ දක්වමින් පූජාවලියේ එන අනුරුද්ධ කුමාර කතාව ඇසුරින් පහදන්න. (ලකුණු 15 යි)

4. (අ) කෝට්ටේ යුගය පද්‍ය කාව්‍යකරණයෙන් බැබලීමට හේතුවූ කරුණු මොනවාද යන්න ඉදිරිපත් කරන්න. (ලකුණු 07 යි)

(ආ) "සැණකෙළි භූමියක සැබෑ ස්වභාවය සහෘද මනසේ චිත්‍රණය කිරීමට ගුත්තිල කවියා සමත් වී ඇත." ගුත්තිල කාව්‍යයේ උදේනිපුර සැණකෙළිය ඇසුරින් විමසන්න. (ලකුණු 08 යි )

5. "විවිධ දුෂ්කරතාවලින් බැට කන ජන කොටසක් වෙසෙන ගමකි බැද්දේගම." බැද්දේගම නවකතාව ඇසුරින් ඊට හෙතු ගෙන හැර දක්වන්න. (ලකුණු 15 යි)

6. "උපාලි කරුණාබර කෘතවේදී ගැමියෙකි" වහල්ලු කෙටි කතාවේ උපාලිස්ගේ චරිතය ඇසුරින් විමසන්න. (ලකුණු 15 යි)

7. කොළඹ යුගයේ ප්‍රථම තරංගයට අයත් කවීන් නම් කර එම තරංගයට අයත් නිර්මාණයන්හි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ මොනවාද යන්න විමසීමකට ලක් කරන්න. (ලකුණු 15 යි)

8. ශෛලිගත නාට්‍යවල මූලික ලක්ෂණ මොනවාද යන්න පැහැදිලි කරමින් ජේමතෝ ජායතී සෝකෝ නාට්‍යයෙහි ඇතුළත් ශෛලිගත නාට්‍ය ලක්ෂණ පෙන්වා දෙන්න (ලකුණු 15 යි)